ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන අධ්‍යනාංශය
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන - 2021/2022
අවසාන පරීක්ෂණය - 2023
**STP8210/STP8309/ESP2109 - ළමා අයිතිවාසිකම්**
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.12.10 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**I වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද II වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (03) පිළිතුරු සපයන්න.**

## I වන කොටස

01. යටත්විජිත යුගයට පෙර ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් පැවැති තත්ත්වය සහ වර්තමානයේ ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් පවතින තත්ත්වය කෙටියෙන් සංසන්දනය කරන්න.

02. ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සතු කාර්යයන් **පහක් (05)** නම් කර ඉන් එකක් (01) කෙටියෙන් විස්තර කරන්න.

03. ක්‍රි.ව.1900 – 2000 දක්වා ශ්‍රී ලංකාවේ සම්මත කරගනු ලැබූ ළමා සුභ සාධනයට අදාළ ආඥාපනත් **පහක් (05)** නම් කරන්න.

04. (i) "විශේෂ තත්ත්වයන් යටතේ පසුවන ළමයින්" යනුවෙන් අදහස් කරන්නේ කවුරුන්දැයි කෙටියෙන් හඳුන්වන්න

    (ii) විශේෂ තත්ත්වයන් යටතේ පසුවන ළමයින් සුරැකීම අරභයා රජය මත පැවරෙන වගකීම් **තුනක් (03)** ලියා දක්වන්න.

05. "වර්තමානයේ ලිංගික අපයෝජනයන් බහුල ලෙස සිදුවන බව මාධ්‍ය අනාවරණය කරනු ලබයි." තම දරුවන් ලිංගික අපයෝජනයෙන් ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් දෙමාපියන්ට යොදගත හැකි ක්‍රියාමාර්ග **තුනක් (03)** කෙටියෙන් සාකච්ඡා කරන්න.

06. "අපත්‍යීකරණය" යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි සුදුසු නිදසුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

07. නිදහසින් පසු ශ්‍රී ලංකා රජය, ළමයින් සතු වර්ධනය හා සංවර්ධන අයිතිය සුරැකීම සඳහා ගෙන ඇති වැදගත් පියවර **පහක් (05)** කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ලෝක ප්‍රජාව ළමා අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා සුදුසු නිර්මාණශීලී සන්නිවේදන ක්‍රමෝපායන් **පහක් (05)** හඳුන්වා දෙන්න. (ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය යනු කුමක් ද? (ලකුණු 04)

(ii) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතියේ 3 වන වගන්තියේ 'ළමයා සතු උපරිම යහපත' පිළිබඳ මූලධර්මය දක්වයි. ඒ පිළිබඳව ඔබේ මතය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ "ළමයාගේ උපරිම යහපත පිළිබඳ මූලධර්මය" ප්‍රවර්ධනයේ දී බාධාකාරී ලෙස බලපාන සාධක තුනක් **(03)** සුදුසු නිදසුන් ඇසුරින් විභාග කරන්න. (ලකුණු 10)

10. (i) 'ජීවත්වීමේ අයිතිය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) "වර්තමාන ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය පාසල් සිසුන්ගේ ජීවත්වීමේ අයිතිය සඳහා ප්‍රබල බලපෑමක් ඇති කර ඇත."

ඔබ මෙම වගන්තිය සමඟ එකඟ වන්නේ ද නොවන්නේ ද යන්න සුදුසු උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) වර්තමාන ශ්‍රී ලංකාවේ ළමයින්ගේ සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය නංවාලීමට ගුරුවරයෙක් වශයෙන් ඔබට කළ හැක්කේ කුමක්දැයි පෙන්වා දෙන්න. (ලකුණු 10)

11. (i) ළමයින් අරභයා 'අපචාර' හා 'අපයෝජන' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) ළමා අපයෝජනය විවිධාකාරයෙන් සිදුවේ. ළමා අපයෝජනය සිදුවිය හැකි ආකාර තුනක් **(03)** කෙටියෙන් ලියා දක්වන්න. (ලකුණු 06)

(iii) ගුරුවරයෙකු ලෙස ඔබගේ පන්ති කාමරයේ ශාරීරිකව අපයෝජනයට ලක් වූ ළමයෙකු සිටින බවට තොරතුරු ලද විටක ඒ සඳහා ඔබ ගන්නා ක්‍රියාමාර්ග මොනවාදැයි පෙන්වා දෙන්න. (අවම වශයෙන් හතරක් **(04)** වත් ලියන්න) (ලකුණු 10)

12. (i) "සහභාගිත්ව අයිතිය" යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) ළමයින් සතු සහභාගිත්ව අයිතිය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී සුරැකීම සඳහා ගුරුවරයෙක් වශයෙන් ඔබට ගත හැකි පියවර තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් කල පියවරවල් ක්‍රියාත්මක කිරීමේ දී ඔබට මුහුණ දිය හැකි අභියෝග හතරක් **(04)** දක්වා ඒවා අවම කිරීමට ඔබ යෝජනා කරන්නේ මොනවාදැයි පෙන්වා දෙන්න. (ලකුණු 12)

13. (i) ශ්‍රී ලංකා රජය විසින් ළමයින්ගේ අයිතීන් පිළිබඳ ව මහජනතාව දැනුවත් කිරීම සඳහා ගෙන ඇති මූලික ප්‍රයත්න හතරක් **(04)** ලියා දක්වන්න. (ලකුණු 04)

(ii) එම ප්‍රයත්නයන් ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා රජය මුහුණ දුන් ගැටලු තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් ගැටලු මඟහරවා ගැනීමට යෝජනා අවම හතරක් (04) සකස් කරන්න. (ලකුණු 10)

14. "ගුරුවරයා සැබෑ ලෙස සිසුන් වටහාගෙන ඔවුන් සමග කටයුතු කරන්නේ නම් නිතැතින් ම ළමා අයිතිවාසිකම් ආරක්ෂා වේ."

(i) මෙම වගන්තිය සමඟ ඔබ එකඟ වන්නේ ද? ඔබේ අදහස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙහි ලා පාසල් විවේක කාලයේ දී ගුරුවරුන්ට යොදාගත හැකි නිර්මාණශීලී උපාය මාර්ග හතරක් **(04)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) මෙම නිර්මාණශීලි උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට සුදුසු කෙටි වැඩසටහනක් යෝජනා කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.